3 වන පිටුවෙන් (යුද්ධය අවසන්ද?)

සිදු කලේත් මේ සෙල්ලමය. ඔව්හු කොමියුනිස්ට් පක්ෂ 4 හා මුස්ලිම් පක්ෂ හැරුණු විට අනෙක් සෑම දේශපාලන පක්ෂයකටම ඇතුළු වී තම මතයට ඒ ඒ පක්ෂවල නායකයන් පොලඹවා ගැනීමට ද ක්‍රියා කළහ.

(ඔවුනට තිබුණේ එකම පරමාර්ථයකි. ඒ පරමාර්ථය වූ කලී ඉන්දියාවේ වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවීම කිසිසේත් කිරීමට ශක්තිමත් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථ ාවෙන් ඉඩක් නැති නිසා ලොව කොතැන හෝ සේවරී දෙමළ රාජ්‍යයක් පිහිටුවාගෙන දෙමළ කොඩිය

(තමලම්මාන් දෙමළ ජාතික ගීය හා දෙමල අනන්‍යතාව රැක ගැනීමය.

මේ සඳහා ඔවුන් තෝරා ගත්තේ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශයයි.

ඔවුන්ගේ ප්‍රධාන සටන් පාඨය වුයේත් "දෙමළ වනාහී රටක් නැති ජාතියක්ය" යන්නයි.

මේ සටන් පාඨය හාස්‍යයට ලක් කරමින් තමිල්නාඩුවේ හිටපු මහ ඇමතිවරයෙකු වූ බත්තවත්සලම් මහතා වරක් කීවේ පංජාබීනට, මාරාටීනට, ගුජරාටීනට, තෙළිඟුනට, මලයාලීනට සහ තවත් බොහෝ ජාතීන්ට ඉන්දියාව තම රට වී තිබියදී මේවා මොන විහිළු කතාද කියාය.

1948 සිට 1970 දක්වා බලයට පත් සෑම රජයක්ම දෙමළ ජනතාවට කළේ බලවත් අසාධාරණකම් බව අවිවාදයෙන් පිළිගත යුතුය. මේ හේතු නිසා 1977 මහ මැතිවරණයේදී වෙනම දෙමළ රාජ්‍යයක් සඳහා ජනවරමක් ඉල්ලමින් දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ කියා සිටියේ පේදුරු තුඩුවේ සිට නැගෙනිහර කුඹුක්කන් ඔය දක්වා අතීතයෙත් දෙමළ රාජ්‍යයක් තිබු බවත්, ඒ රාජ්‍යය යළිත් ස්ථාපිත කළ යුතු බවත් ය. උතුරු පළාතේ සියලුම ආසන ඒ පක්ෂය ජයගත් නමුත් නැගෙනහිර පළාතේ ආසනවලින් ඔවුනට ලැබුණේ ආසන 4 ක් පමණි.

මැතිවරණ ප්‍රකාශනයේ එසේ සඳහන් වුවද දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ සාධාරණ විසඳුමකට එළඹීම ප්‍රතික්ෂේප කළේ නැත.

එහෙත් ?

1983 කළු ජුලියෙන් පසු ඉතා අදුර දර්ශී අන්දමින් ජයවර්ධන රජය සම්මත කරගත් ව්‍යවස්ථා සංශෝධනය නිසා දෙමල එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ට ආත්ම ගෞරවය ඇතිව පාර්ලිමේව්තුවේ අසුන් ගැනීම කලනොහැකි වීය. ඔවුහු ඉල්ලා අස්වුහ.

විධායක ජනාධිපති ධුරය උඩ තමාට අයිති බලතල අනුව රිසි දෙයක් කළ නැති යැයි විශ්වාස කල ජනාධිපතිවරයා එතැන් පටන් පාර්ලිමේන්තුව ගෙන ගියේ ආසන 168 කින් සංයුක්ත සභාවේ ආසන 16ක් පුරප්පාඩුව තබමිනි.

දෙමළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනය අවසන් විය.

83 සංහාරය මෙන්ම මෙයද ඩයස්පෝරාවේ අභිනන්දනයට හේතු විය.

එතැන් පටන් සිදු වූ විනාශය ඉතිහාසයට එක් වී ඇත.

2005 දක්වා බලයට පත් සෑම රජයක් ම ඩයස්පෝරාවේ උපක්‍රමවලට ගොදුරු විය.

1989 දී ඉන්දියානු හමුදාවට පිටවන්නැයි කී ජනාධිපති ප්‍රේමදාස, ඩයස්පෝරාවේ ඇන්ටන් බාලසිංහම් හා ඇඩෙල් බාලසිංහම් කොළඹට කැඳවා 'සාකච්ඡා අරඹමින් ' කොටි සංවිධානයට භාණ්ඩාගාරයේ යු.ඒ. ආයුධ හා මුදල් දෙන ලද්දේ "ඉන්දියාවට පක්ෂ යැයි කියන් " උතුරු-නැගෙනහිර පිරිස් සමුල ඝාතනය කිරීම සඳහා ය.

'පණ අදමින් සියියා වූ කොටිනට අපි ඔක්සිජන් දුන්නා' යැයි රංජන් විජේරත්න මහතා පැවසුවේ මේ අවස්ථාවේය.

ප්‍රතිඵලය වුයේ රංජන් විජේරත්න හා ජනාධිපති ප්‍රේමදාස පමණක් නොව ගාමිණී දිසානායක ප්‍රමුඛ දේශපාලඥයන් රාශියක් කොටින්ට බිලි වීමය.

ඩයස්පෝරාව මේ සියලු ඝාතනවලින් උද්දාමයට පත් වීය. තමන් එකතු කරන මුදල් අපතේ නොවන බව ඔවුහු විශ්වාස කළහ. අද ප්‍රභාකරන් නැත. ඔහුගේ ප්‍රධාන සගයන්ද ජීවතුන් අතර නැත. ඔහුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරන ලද ඩයස්පෝරාවේ ප්‍රබලම 'භූතයා' වූ කේ.පී. ද දැන් සිටින්නේ සිර කුඩුවේය.

ඒ සියල්ල සිදුවෙද්දී ඩයස්පෝරාව ඊළඟ සටන අරඹා ඇත. ඔවුන්ගේ ප්‍රචාරක සටන සඳහා ඔවුනට සම්පත් ඇත. කොතරම් බාධක තිබුණත් සම්පත් එක්කර ගැනීමේ කර්තව්‍යයද ඔවුහු දිගටම කරගෙන යති. ඔක්තෝබර් 02 ද ජර්මනියේ පැවැත්වෙන සමුළුවෙන් පසු ඔවුන් තවත් ශක්තිමත් වනු ඇත.

"අපි දෙමළ " ව්‍යාපාරය තුළින් පණ ගැන්වුනු ඩයස්පෝරාව පරාජය කල නොහැකිද? එසේ කිරීමට විශාල බාධාවක් වී ඇත්තේ ශ්‍රී ලංකාවේ දේශපාලන තලයේ ඇතැම් කොටස් රට මුහුණ පා ඇති මේ භයානක තත්වය තේරුම් නොගෙ න සිටීමය.

එක් දේශපාන නායකයෙකු කියා ඇත්තේ රජය ප්‍රජාතාන්ත්‍රවාදීව කටයුතු කරන්නේ නම් "අපි GSP + සහනය ලබා දීමට ක්‍රියා කරනවා" යනුවෙනි. මෙය හතර බීරි කතාවකි.

1940 දී එංගලන්තයෙන් කම්කරු විපක්ෂය මෙබදු ප්‍රතිපත්තියක් අනුගමනය කලේ නම් මුළු ලෝකයම ජර්මනියේ පැසිස්ට් ඒකාධිපතිත්වයට යටත් වීමට ඉඩ තිබුණෝය.

රටේ මාධ්‍ය නිදහසක් නැත යැයි ඇතැම් හු කෑ කෝ ගසති. මා ලංකාවේ ගත කළ මාස කිහිපය තුල යටත් පිරිසෙන් ටෙලිවිෂනයේ ජාල දෙකක්වත් තනිකරම රාජ්‍ය විරෝධී ප්‍රචාර ගෙන යන බව පැහැදිලිව දුටිමි. උද්ඝෝෂණවල නිමාවක් නැත. ඉතා සුළු දේවල්වල පවා වර්ජන පැවැත්වේ.

"යුද්ධය ඉවරයි දැන් ඉතිං අපට කෑම සහ පඩි වැඩි කරන්න ඕනෑ" මිනිස්සු ඉන්නේ පාං කියාගන්න බැරුවයි. දූෂණය පරදවමු පිටුදකිමු" මේ සටන්පාඨ අසන්නේ එකම පක්ෂයේ අය මනාප සඳහා කෙළ ගනිති.

එක් රූපවාහිනී නාලිකාවක් ඇතැම් අපේක්ෂකයන් කරන අසභ්‍ය කතා ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කරයි.

මේ සියල්ලේම වාසිය ඩයස්පෝරාවටය. මේ තත්වය තේරුම් ගැනීමට නොහැකි වුවහොත් ජාතියේ ඉරණම ඉතා භයානක විය හැකිය.

ඩයස්පෝරාව පරාජය කිරීම ප්‍රභාකරන් 'තොලංචි' කිරීමට වඩා ඉතාම දුෂ්කර වන්නේ එය ලොව පුරා විසිර ගොස් ඇති බැවිනි. අද ඇත්තේ කුඩා ලෝකයකි. ඒ කුඩා ලෝකය නිසා ලංකාවද ලෝක සිතියමේ ජේනවාටත් වඩා කුඩා තිතකි.

Victoria Mercantile
LAWYERS

⇒ Advice On Legal Matters
⇒ Motor Vehicle Disputes/Claims
⇒ Debt Recovery & Enforcement

Anne Heenatimulla LLM (Monash)
Barrister & Solicitor
Attorney-at-Law (Sri Lanka)

Phone: (03) 8787 8590
Mobile: 0401 684 689
Email: VMLawyers@y7mail.com
Address: 10 Yellowbox Crescent, Lyndhurst VIC 3975



STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සදහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243

ඔබේ උත්සව අවස්ථාවට
Hennessy Catering Services
රස ගුණ පිරි ආහාර සපයන්නෝ
බුරියානි
කහ බත්
ෆ්‍රයිඩ් රයිස්
ආප්ප
කොත්තු
වෙනත් ඕනෑම කෑමක්



ලොකු පොඩි ඕනෑම සාදයකට උත්සවයකට
15 Hennessy St Epping 3076
Tel 03 8320 3932
Mobile 0432 721 967